දුරකථන/தொலைபேசி/ Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretery } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax-2784846

ඉ-තැපැල්/மின்னஞ்சல்/E-mail- isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල.
'இசுருபாய',ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை, பத்தரமுல்லை.
'Isurupaya', Sri Jayawardanapura Kotte, Baththaramulla.

මගේ අංකය / எமது இல. / My No } ED/09/96/01/08/1

දිනය / திகதி / Date } 2017/11/29

චක්‍රලේඛ අංක - 44/2017

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම විදුහල්පතිවරු

## "කළණ මිතුරු - පොත් සුමිතුරු"
## තිරසර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන - 2018

සමාජමය අභියෝග ජයග්‍රහණය කර වීම උදෙසා පාසල් දරුවන් යොමු කළ යුතු ය. ලෝකයේ ආර්ථික, දේශපාලනික සමාජ හා සංස්කෘතික අභිමතාර්ථ හඳුනා ගැනීමටත්, ඒ සඳහා හේතුකාරක වන සියලු හර පද්ධති හඳුන්වා දීමත් අරමුණු කොටගෙන, ළමුන් පොත පත පරිශීලනය සඳහා යොමු කර වීම අත්‍යවශ්‍ය ය. ඒ වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "කළණ මිතුරු - පොත් සුමිතුරු" තිරසර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලය හා එක්ව මෙම වසරේ දී නව මුහුණුවරකින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඊට අනුකූලව මෙම කියවීම් ප්‍රවර්ධන වැඩසටහන අදියර හතරකින් ක්‍රියාත්මක කළ යුතු වේ.

1. පළමු අදියර - පාසල් මට්ටම

සපයා ඇති උපදෙස් සංග්‍රහයට අනුව 6-13 ශ්‍රේණිවල ඉගනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා කාර්ය සටහන් පත්‍රිකා ගොනුවක් හඳුන්වා දීමට හා පාසලේ තරග කමිටුවක් ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. කාර්ය සටහන් පත්‍රිකා ගොනුවේ අඩංගු සටහන් ඇගයීමට භාජනය කිරීම මඟින් පංති මට්ටමින් (සමාන්තර පංති ආවරණය වන පරිදි) හොඳ ම කියවන්නන් 5 දෙනකු තෝරා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. පාසලේ පුස්තකාලයේ පොත් අතරින් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල්වල භාවිතය සඳහා අනුමත කල පොත් අතරින් ළමුන්ගේ කැමැත්ත පරිදි, සුදුසු සාහිත්‍ය කෘතියක් තෝරා ගෙන ඊට අදාළ ව කාර්ය සටහන් පත්‍රිකා ගොනුව සම්පූර්ණ කර පංති භාර ගුරුවරයාට බාර දිය යුතු ය. (කාර්ය සටහන් පත්‍රිකා ගොනුවේ ආදර්ශයක් මේ සමග යා කර ඇත) කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ලෙසින් වර්ග කරනු ලැබේ. කනිෂ්ඨ අංශය සඳහා හොඳම කාර්ය සාධන සටහන් ඉදිරිපත් කල තිදෙනෙක් ද ජ්‍යෙෂ්ඨ අංශය සඳහා දෙදෙනෙක් ද ලෙසිනි. පංති භාර ගුරුවරයා විසින් පංති මට්ටමේ හොඳම සටහන් 5 තෝරාගෙන පාසලේ තරග කමිටුවට භාර දිය යුතු ය. තරග කමිටුව විසින් මෙසේ තෝරා ගැනෙන අය (6 – 13 පංති පැවැත්වෙන පාසලක නම් උපරිම 40) අතුරින් 6-9 ශ්‍රේණිවලින් හොඳම කාර්ය සටහන් පත්‍රිකා තුනක් ද 10-13 ශ්‍රේණිවලින්

හොඳම කාර්ය සටහන් පත්‍රිකා 2ක් ද වශයෙන් ඉහත ක්‍රමවේදයම භාවිතා කොට පාසල වෙනුවෙ. හොඳම කියවන්නන් 5 දෙනෙකු පමණක් තෝරා ගත යුතු ය. එසේ තෝරා ගන්නා සිසුන්ගේ කාර්ය සටහන්වල පිටපත් කලාප අධ්‍යාපන කාර්යාලයට ලබා දීමට විදුහල්පතිවරු කටයුතු කළ යුතු ය.

පාසලෙන් තෝරාගත් සිසුන්ගේ කාර්ය සටහන් පිටපත් කලාප කාර්යාලයට යොමු කිරීමෙන් පසුව වුවද ඔවුන්ගේ කියවීම් ප්‍රවර්ධන වැඩපිළිවෙල තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක විය යුතුය. මේ අනුව පාසල් පුස්තකාලය මගින් පොත් කියවීම හා කාර්ය සටහන් ලිවීම නොකඩවා ඉදිරියට මෙහෙයවිය යුතුය. සාර්ථක කාර්ය සටහන් වාර්තා 50 කට වඩා ඉදිරිපත් කරන සිසුන් තෝරාගෙන පහත සඳහන් පරිදි පදක්කම් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වේ.

I. 50% කට වඩා ලකුණු ලබා ගත් කාර්ය සටහන් වාර්තා 50ක් සම්පූර්ණ කරන සිසුන් රිදී පදක්කම්ලාභීන් ලෙස ද (ලකුණු ලබා ගන්නා ක්‍රමවේදය උපදෙස් සංග්‍රහයේ දැක් වේ)

II. 50% කට වඩා ලකුණු ලබා ගත් කාර්ය සටහන් වාර්තා 75ක් සම්පූර්ණ කරන සිසුන් රන් පදක්කම්ලාභීන් ලෙස ද

III. 50% කට වඩා ලකුණු ලබා ගත් කාර්ය සටහන් වාර්තා 100ක් සම්පූර්ණ කරන සිසුන් ප්ලැටිනම් පදක්කම්ලාභීන් ලෙස ද

හඳුනාගෙන 2018 වර්ෂයේ නොවැම්බර් මස අවසන් වීමට ප්‍රථම පදක්කම්ලාභීන් ගේ නාම ලේඛනය සහිතව අවශ්‍ය පදක්කම් ප්‍රමාණය ඔබ කලාපයේ පාසල් පුස්තකාල විෂය භාර අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.

2. දෙවන හා තෙවන අදියර - කලාප මට්ටම හා පළාත් මට්ටම

පාසල් මට්ටමින් තෝරා එවනු ලබන හොඳ ම කියවන්නන් අතුරින් දී ඇති උපදෙස් පරිදි කලාප මට්ටමින් හොඳ ම කියවන්නන් 20 දෙනෙකු තෝරා ගැනීමටත් ( 6-9 ශ්‍රේණිවලින් 10 ක් හා 10-13 ශ්‍රේණිවලින් 10ක් ලෙස), කලාප මට්ටමින් තෝරා එවනු ලබන හොඳ ම කියවන්නන් අතුරින් පළාත් මට්ටම සඳහා හොඳ ම කියවන්නන් 10 දෙනෙකු තෝරා ගැනීමටත් කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

3. සිව්වන අදියර - ජාතික මට්ටම

පළාත් මට්ටමේ ප්‍රමුඛයින් තෝරා ගැනීමෙන් අනතුරුව ඔවුන් රූපවාහිනී (Reality) ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකට යොමු කරනු ලැබේ. ඒ පිළිබඳ තොරතුරු ඉදිරියේ දී ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම - 1

කරග ප්‍රතිඵල පහත සඳහන් දින වකවානුවලට අනුව නිසි පරිදි භාරදිය යුතුය

1. පාසලෙන් තෝරාගත් සිසුන්ගේ කාර්ය සටහන් පිටපත් 2018.05.04 දිනට පෙර කලාප කාර්යාලයට භාරදිය යුතුය.

2. කලාප මට්ටමෙන් තෝරාගත් සිසුන්ගේ කාර්ය සටහන් පිටපත් 2018.07.26 දිනට පෙර පළාත් කාර්යාලයට භාරදිය යුතුය

3. පළාත් මට්ටමේ කණ්ඩායම තෝරාගැනීම 2018.09.28 දිනට පෙර සිදු කළ යුතුය

# ආදර්ශ කාර්ය සටහන් පත්‍රිකාව

## ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය

1. ශානර වර්ගය - ළමා කතා
2. ග්‍රන්ථ නාමය - පුංචි ක්‍රිෂ්ණා
3. පරිග්‍රහණ අංකය - 3369
4. කතුවරයාගේ නාම - චම්පිකා දීපානි රණසිංහ
5. ප්‍රකාශනය - සී/ස සදීපා ප්‍රකාශකයෝ
6. මුද්‍රිත වසර - 2015
7. පිටු ගණන - 120
8. මිල - රු. 240.00

## සාහිත්‍ය අංග

1. චරිත - ක්‍රිෂ්ණා කුමරු, බලාරාම යශෝදා දේවිය, කම්සා රජු, යක්ෂයෝ
2. ප්‍රධාන චරිත - ක්‍රිෂ්ණා කුමරු, බලාරාම, යශෝදා දේවිය
3. ප්‍රතිවිරුද්ධ චරිත - කම්සා රජු, යක්ෂයෝ
4. සෙසු චරිත - රාධා, විශාඛා, ලලිතා

## කතා වස්තු සටහන

1. පසුතලය

   බ්‍රින්දාවනයම

2. ගැටළු


   කම්සා රජු ක්‍රිෂ්ණා කුමරු විනාශ කිරීම සඳහා යක්ෂයින්ව බ්‍රින්දාවනයට එවීම

3. ශිඛරය

   කම්සා රජු ක්‍රිෂ්ණා කුමරුව විනාශ කිරීමට අගසුරා යක්ෂයා බ්‍රින්දාවනයට යැවීම

4. විසඳුම

   ක්‍රිෂ්ණා කුමරු යක්ෂයින් පැමිණෙන සෑම අවස්ථාවක බ්‍රින්දාවනය ආරක්ෂා කිරීම




විචාරය (100 – 150)

මෙම පොත ඉතාමත් ලස්සන ළමා කතාවකි. මෙම කතාවෙහි සඳහන් වන ක්‍රිෂ්ණා කුමරු ඉතා හොඳ යහගුණවලින් පිරිපුන් ළමයෙකි. අපගේ ජීවිතය සාර්ථක කර ගැනීමට ක්‍රිෂ්ණා කුමරුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහෝ ය. පරාර්තකාමී බව, නිරහංකාරය, කළ ගුණ සැලකීම, එවැනි ආදර්ශ කිහිපයකි. තවද සැබෑ මිත්‍රත්වය උස් පහත්, පොහොසත් භේදයක් නැත යන්න ක්‍රිෂ්ණා කුමරුගෙන් ගත හැකි අපූරු ආදර්ශයකි. මෙම කතාව පහසුවෙන් තේරුම් ගැනීමට හැකි වන අයුරින් බස හසුරුවා ඇත. මෙහි ඇති ලස්සනම ලස්සන චිත්‍රත් සරල භාෂාවත් නිසා මෙම පොත කියවීමට මම බොහෝ ආසා කරමි. මෙම පොතෙන් මම රසයක් මෙන්ම දැනුමක් ද ලබා ගත්තෙමි. මෙම පොත කියවීමෙන් පරිසරයට ආදරය කිරීමට මෙන්ම සතුන්ට ආදරය කිරීමට ද හුරු පුරුදු වේ. කුඩා දරුවන් වන අපගේ ජීවිත සාර්ථක කර ගැනීමට මෙම පොත ඉවහල් වේ.

ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය - 10

සාහිත්‍ය අංග - 20

කතාවස්තු සටහන - 20

විචාරය - 27

අත්අකුරු - 08

ව්‍යාකරණ - 08

මුළු ලකුණු - 93

ශිෂ්‍යාවගේ නම - තරුෂි මධුමාලි තෙන්නකෝන්

පාසල - ව/ම/ම ඇඹලේගොඩ මහා විද්‍යාලය, නාගොල්ලාගම